# ප්‍රශංසා එකතු සුපුවත

2017 අගෝස්තු මස 07 වන දින සිට අගෝස්තු මස 13 වන දින දක්වා

## "බැගෑ සිතින් දෙවි සරණ පතන්නෝ (සිතින් දිළින්දෝ) භාග්‍යවන්තයෝය; ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේය"

01 ප්‍රශංසාව සඳහා :

* මහෝත්තමවූ දෙවි සමිඳාණන් වහන්සේ මිනිසාගේ මැවුම්කරුවාණන් වන බැවින්, මිනිසාගේ ජීවිතය ඔවුන් වහන්සේගේ ශුද්ධවූ හස්තයෙහිය. එහෙයින් සෑම මිනිසෙක්ම එක්තරා අන්දමකින් මැවුම්කරුවාණන් ඉදිරියේ දිළින්දෙකි.
* අපගේ දීනතාවය පිළිගෙන ඔවුන් වහන්සේ අපගේ දෙවි සමිඳාණන් වහන්සේ වන බැවින් වන්දනාව, නමස්කාරය පුද කරමින් සදාතනික ප්‍රේමය වර්ණනා කරමු.
* මම එතුමාණන්ගේ ගුණ වර්ණනා කරමි. නිහතමානි අය ඒ අසා සතුටු වෙත්වා. (ගීතා 34:2)
* පුබුදු ගී අංක 229 "හදවත මගෙ සමිඳුන්ගේ ගුණ පසසන්නේ....."

02. සතියේ අත්දැකීම් බෙදා ගැනීම :

* පසුගිය සතිය පුරා ඔබ අත්දුටු සමිඳාණන්ගේ ශු. ප්‍රේමයෙන් බිඳක් අන් අය සමඟ බෙදා ගන්න. "ශුද්ධවූ ප්‍රේමය" යනු වෙනස්, අනන්‍යවූ ප්‍රේමයයි.

03. සතියේ සුපුවත:

* සිතින් දිළිඳු අය තමන්ගේ මුළු විශ්වාසය දෙවියන් වහන්සේ කෙරෙහි පමණක් තබා ඔවුන් වහන්සේගේ ශුද්ධවූ කැමැත්තට යටත් වෙති. එමගින් ඔවුන් වහන්සේ ගේ ප්‍රේමයේ පාලනයට නතු වෙමින් යැපීමේ ජීවිතයක් ගත කරති. ප්‍රේමය භුක්ති විඳිති. දේව රාජ්‍යය උරුම කර ගනිති.
* ශු.මතෙව් 19:16-22 (පොහොසත් තරුණයා)
  වරක් එක් මිනිසෙක් ඔවුන් වහන්සේ වෙත අවුත් ගුරු දේවයිනි, සදාතනික ජීවිතය බලනු වස් මා කුමන යහපතක් කළ යුතුදැයි ඔවුන් වහන්සේගෙන් ඇසීය. ඔවුන් වහන්සේ පිළිතුරු දෙමින් ...... ඔබ සර්ව සම්පූර්ණ වන්නට කැමැත්තෙහි නම් ඔබ සතු සියල්ල විකුණා දිළිඳුන්ට දෙන්න.... එන්න මා අනුගාමී වන්නැයි ඔහුට වදාළ සේක.
* මෙම සුවිශේෂ වාක්‍ය මගින් ක්‍රිස්තුන් වහන්සේගේ දිළිඳු භාවය ගැන කුමක් පවසයිද? බෙදා ගන්න.

04. වචනයේ සේවකයා සඳහා:

* දේව රාජ්‍යය උරුම කර ගන්නට දිළිඳුකම ආශිර්වාදයක් ලෙස ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක.
* ක්‍රිස්තුන් වහන්සේ මිනිසත් බව ගෙන මෙලොවට වැඩම කොට මිනිසාට එකමුතුව ජීවත් වූ අයුරින්ම එනම් ඔවුන් වහන්සේ සැබෑ මනුෂ්‍ය පුතෙකු ලෙස දිවි ගෙවූ ආකාරයෙන්ම දේව රාජ්‍යයේ දිළිඳුන්ට තිබෙන තැන කුමක්දැයි මුළු දිවි පෙවෙත මගින් සාක්ෂි දැරූ සේක.
* **දෙවි සමිඳාණන්ගේ ආත්මානුභාවය මා කෙරෙහි පිහිටා ඇත. දිළිඳුන්ට සුභ අස්න දෙසීමටද බිඳුනු සිත් ඇත්තන්ට සුව සෙත දීමටත්.... සමිඳාණන් මා ආලේප කළ සේක.** (යෙසායා 61:1-2)

05. අප දෙස :

* අප දේශය තුළ සම්පත් බහුතරයක් අයිති කරගෙන සුබෝපභෝගී ජීවිත ගත කරන පිරිසක් වෙති. ඉතිරි සුළු සම්පත් ප්‍රමාණය බහුතරයකට භුක්ති විඳීමට සිදු වී ඇති බව අපි දනිමු. එබැවින් ජීවිතයේ අවැසිතාවයන් පිරිමසා ගත නොහැකිව බොහෝ අය අසරණකමට පත්ව සිටී.
* එසේ නම් සමිඳාණන් වහන්සේ ඔබට මට කුමක් පවසයිද? ඔවුන් වහන්සේගේ ශු.කැමැත්ත සොයන්නට, ඉටුකරන්නට බලය පතා යදිමු. මනස්ථාපනය වී සිත අළුත් කර ගනිමු.

06. පුබුදු ගී අංක 208 "දිළින්දෙනි ඔබ......"

==========================

# ප්‍රශංසා එකතු සුපුවත

2017 අගෝස්තු මස 14 වන දින සිට අගෝස්තු මස 20 වන දින දක්වා

## "ශෝක වන්නේ භාග්‍යවන්තයෝය; ඔවුහු සැනසීම ලබන්නෝය"

01. ආරම්භක ප්‍රශංසාව : පුබුදු ගී අංක 10 "ශුද්ධාත්මයාණෙනි වඩිනු මැනේ ....."

දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීමේ දීමනාව අප ලද සුවිශේෂී භාග්‍යයකි. ජීවිතයේ අප අත්දකින, පසුකරන ඕනෑම තත්ත්වයකදී ප්‍රශංසා කිරීමේ පිපාසය අප තුළ ඇති කරන ශුද්ධාත්මයාණ් වහන්සේට වඩ වඩා ඉඩ දෙමින් අද දවසේ ප්‍රශංසාවට ඇතුළු වෙමු. ප්‍රශංසාව තුළ අප අත්දකින බලය අපව ගලවන බව, නිදහස් කරන බව විශ්වාස කරමින් ප්‍රශංසා කරමු.
පුබුදු ගී අංක 103 "තුති ප්‍රශංසා වේ....."

02. දවසේ සුපුවත:

ශු.මතෙව් 5:4 (පොදුවේ ප්‍රකාශ කරන්න)

**"ශෝක වන්නෝ භාග්‍යවන්තයෝය ; ඔවුහු සැනසීම ලබන්නෝය"**

අප සවන් දුන් දේව වචනය සැබවින්ම අප ජීවිත පුදුමයට මෙන්ම සැනසීමට පත් කරනවා නොවේද? සමිඳාණන් පවසන භාග්‍ය මනුෂ්‍ය බුද්ධියෙන් නම් වටහා ගත නොහැකිය. ශෝක වන්නෝ භාග්‍යවන්තයි කියා කිව හැකි මනුෂ්‍යයෙක් සිටීද? ශෝක වන්නන් සැනසීම ලබන්නේ කෙසේද? මනුෂ්‍යයන් වන අපට දුක, වේදනාව ශෝකයක්මය. තවත් පැත්තකින් ශෝකවීම අභාග්‍යක්, අවාසනාවක් ලෙස අප සිතමු. එහෙත් ක්‍රිස්තියානි කාරයන් වන අපට ශෝකවීම තුළම ඇති භාග්‍ය, සතුට සමිඳාණන් වහන්සේ ප්‍රකාශ කර සිටියේ තම ජීවිතයෙන්ම ය. කුරුසියේ මරණය වේදනාවක් වුවද, ශෝකයක් වුවද මුළු විශ්වයම ගලවන්නට ශක්තිය බලය ලැබුනේ ඒ මරණය තුළය. එමනිසා ශෝකවීම තුළම දෙවිඳුන් වෙතට ළඟා වන්නට අපට ඇති අවස්ථාව සැනසීම ලබන්නට අපට මඟ පෙන්වනු ඇත.

03. අප දෙසට :

* ක්‍රිස්තුන් වහන්සේ උදෙසා දුක්විඳීම, පීඩා විඳීම තුළ ඇතිවන ශෝකය අත්දකින්නට ලැබීම සැබවින්ම භාග්‍යයකි. ක්‍රිස්තියානි කාරයන් හැටියට අප ලබා ඇති කැඳවීම ද එයය.
(ළඟ සිටින කෙනෙකු සමඟ බෙදා ගන්න)

* අප ශෝක වන විට අප කොතෙක් නම් අවදි වනවාද?
ශෝකවීම තුළම දෙවිඳුන් අත්දකින්නට තියෙන අවස්ථාවන් වලට අවදි වෙනවද?

* එසේත් නැත්නම් අප අත්දකින, පසු කරන තත්ත්වයන් සමඟ එපාවීම, කලකිරීම අප ජීවිත වසාගෙන සිටිනවාද?

* "ශෝක වන්නෝ භාග්‍යවන්තයෝය; ඔවුහු සැනසීම ලබන්නෝය" අපි අපේ ජීවිත තුළ මෙම භාග්‍ය අත්දකිනවාද?

04. සතිය පුරා:

ක්‍රිස්තුන් වහන්සේ උදෙසා ශෝකවීමේ භාග්‍ය අත්දැක සැනසීම ලබමු.

05. අවසාන ප්‍රශංසාව :

පුබුදු ගී අංක 124 "සාමයේ ප්‍රීතියේ......."

==============================

# ප්‍රශංසා එකතු සුපුවත

2017 අගෝස්තු මස 21 වන දින සිට අගෝස්තු මස 27 වන දින දක්වා

## "නිහතමානී ගුණ ඇත්තෝ භාග්‍යවන්තයෝය"

01 ආරම්භක ගීය - පුබුදු ගී අංක 5 "ඥාන වීර්ය ශක්ති දැනුම...."

02 ප්‍රශංසාව සඳහා යොමුව:

"මා අනුගාමී වන්නයැ"යි සමිඳාණන් වහන්සේ කළ ආරාධනය පිළිගෙන ඔවුන් වහන්සේ පසුපස යන්නට තීරණය කළ ඔබ/මම මොනතරම් භාග්‍යවන්තද? අප ජීවිතයේ අත්දකින සෑම තත්ත්වයක්ම භාග්‍යවන්තයැයි සිතන්නට අපට ඇති හැකියාවම සැබවින්හ භාග්‍යයක් නොවේද? දිළිඳුකම, පීඩාව, තනිහාවය තුළ ඇති භාග්‍යවන්තකම දකින්නට හැකිවනුයේ සමිඳාණන් දෙසම බලා ඔවුන් වහන්සේ අනුගාමී වන ඔබට/මට පමණකි. ඒ විශේෂ වරප්‍රසාදය ලැබූවන් ලෙස අද දවසේ ගැඹුරු ඇතුලාන්ත ප්‍රීතියකින් ප්‍රශංසාවට ඇතුළු වෙමු.

පුබුදු ගී අංක 129 "පූර්ණයාණෙනි ඔබ දකින තුරා ......"

03 දවසේ සුපුවත:

"නිහතමානි ගුණ ඇත්තෝ භාග්‍යවන්තයෝය; ඔවුහු දේශය උරුම කර ගන්නෝය"

(ශු.මතෙව් 5:5)

සමිඳාණන් වහන්සේ අනුගාමී වන්නන් තුළ තිබිය යුතු ඉතා උතුම් ගුණාංගයකි නිහතමානි බව.

* මැවිල්ලේ උතුම්ම මැවිල්ල ලෙස මිනිසාව මවමින් දෙවියන් වහන්සේ ඔවුනට දුන් පොරොන්දුව නිහතමානීව හා විශ්වාසයෙන් යුතුව බාර ගැනීම ඔවුන් වහන්සේ මනුෂ්‍යයාගෙන් බලාපොරොත්තු විය. එහෙත් එය එලෙස සිදු නොවීය.
* තත්ත්වයට, මානයට, සැප සම්පත්වලට, උසස්යැයි සම්මත දෙයට, ලැබී ඇති දෙයට වඩා වැඩි දෙයක් ලබා ගැනීමේ බලාපොරොත්තුවට දෙවියන් හා සමාන වීමට උත්සාහ දැරීමට ක්‍රියා කළ මිනිසා නිහතමානී වෙනවා වෙනුවට උඩඟුකමේ පාපයට ඇද වැටිනි.
* මිනිසා එලෙස උඩඟු වුවද දෙවියන් වහන්සේ මිනිසා උදෙසා නිහතමානි විය. පාපයට ඇද වැටුනු මිනිසාව ගලවා ගන්නට ඔවුන් වහන්සේ මනුෂ්‍යයෙක් ලෙස මෙලොවට පැමිණියේ නිහතමානි ගුණය පෙන්වා දෙමිනි.
* ජේසු සමිඳාණන් වහන්සේද මුළු ජීවිතයෙන්ම නිහතමානි ගුණය ප්‍රකාශ කළ සේක. එය කෙසේදයත් සිය ජීවිතය පවා පූජා කළ සේක.
* පිලිප්පි 2:6-8 දක්වා කොටස පොදුවේ ප්‍රකාශ කරන්න. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සතු වූ නිහතමානි ගුණය ගැන ළඟ සිටින කෙනෙකු සමඟ බෙදා ගන්න.

04 සතිය පුරා:

* පිලිප්පි 2:6-8 කොටස ඇසුරින් ජේසු සමිඳාණන් දෙස බලන අප ඉදිරියේ ඇති අභියෝගයට අවදි වෙමු.
* නිහතමානි ගුණය ඇති ඔබ සැබවින්ම භාග්‍යවන්තයැ යි සමිඳාණන් ඔබට/මට පවසනවාදැයි අපේ ජීවිත දෙස හැරී බලා මෙනෙහි කරමු.
* අපේ ජීවිත පැවැත්ම, ප්‍රතිචාරයන් සියල්ලම නිහතමානි ගුණය ප්‍රකාශ වන ක්‍රියාවන්දැයි විමසා බලමු.
* නිහතමානි වන්නන් හට දෙවියන් වහන්සේ දානය කරන උසස් බව (පිලිප්පි 2:9-11) සදාතන ජීවිතය හිමිකර ගැනීමේ වරප්‍රසාදය පතා යාච්ඤා කරමු.

05. අවසාන ප්‍රශංසාව - පුබුදු ගී 105 "දෙන්න සමිඳුනි ......."

==========================

**ප්‍රශංසා එකතු සුපුවත**

2017 අගෝස්තු මස 28 වන දින සිට සැප්තැම්බර් මස 02 වන දින දක්වා

**"යුක්තිය උදෙසා පීඩා විඳින්නෝ භාග්‍යවන්තයෝය; ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේය "**

01. ප්‍රශංසාව සඳහා :

* සමිඳාණන් වහන්සේගේ ශුද්ධවූ කැමැත්ත මඟින් හෙළිදරව් වන්නේ ඔවුන් වහන්සේගේ දිව්‍යමය කරුණාව හා දිව්‍යමය යුක්තිය වන බැවින් අපි ඔවුන් වහන්සේගේ ශුද්ධ නාමය පසසමු. ගරු පැසසුම් පුද කරමු. මන්ද අපි ඔවුන් වහන්සේගේ කරුණා ආලෝකය තුළ හැසිරෙමු, පවතිමු නම් සමිඳාණෝ ජයග්‍රහණය අත්පත් කර දෙන සේක.
* පුබුදු ගී අංක 156 - "කපාල හෙල තෙක් පිරූ කුරුසියේ....."

02. සතියේ අත්දැකීම් කිහිපයක් බෙදා ගනිමු.

* ශුද්ධාත්මයාණන් වහන්සේ පසුගිය සතිය පුරා ඔබට මඟ පෙන්වූ ආකාරය මෙනෙහි කරමින් හා ඔබ ලද අත්දැකීම් සාංඝික කර ගන්න.
* ඔවුන් වහන්සේගේ ශුද්ධවූ කැමැත්ත ඔබට මඟ පෙන්වූ අයුරු බෙදා ගන්න.

03. දවසේ සුපුවත

* දේව රාජ්‍යයේ උරුමය ප්‍රධානය කිරීමට ඔවුන් වහන්සේ ඇරයුම් කරන්නේ කාටද? ඔවුන් වහන්සේගේ ශුද්ධවූ කැමැත්තට අනුකූලව සිටිමින් යුක්තිය ඉටු කිරීමේදී පීඩා වින්ද අයටයි.
* ගීතාවලිය 82:3-6 **"දුබලුන්ට හා අනාථයන්ට යුක්තිය පසිඳලන්න. පීඩිතයන් හා දිළිඳුන්ට යුක්තිය ඉටු කරන්න. දුබලයන් හා දිළිඳුන් මුදාලන්න දුදනන්ගේ ග්‍රහණයෙන් ඔවුන් බේරා ගන්න... ඔබ සියල්ලන් අතී උත්තමයාණන්ගේ දරුවෝ වන්නහුය."**
* ඉහත ශු. ලියවිලි පාඨය කියවා, සමිඳාණන් වහන්සේ අපට හෙළිදරව් කරන ශුද්ධවූ කැමැත්ත කුමක්දැයි බෙදා ගන්න.

04. වචනයේ සේවකයා සඳහා:

* මිනිසාගේ හදවත තුල යුක්තිය පිළිබඳව මහත් පිපාසයක් ඇත. එම නිසාම අයුතුකම් අසාධාරණකම් විඳිමට ඔහු කැමති නැත. ඒවා විඳදරා ගැනීමටද අපහසුය. එවැනි තත්ත්වයන් ඉදිරියේ ඔහු හඬා වැළපෙන්නේද, කෝපාවිෂ්ඨ වන්නේද විටෙක ද්වේශ සහගතව ක්‍රියා කරන්නේද එබැවිනි.
* එහෙත් සමිඳාණන් වහන්සේ අපට පරමාදර්ශයක් දුන් සේක. ක්‍රිස්තු ශ්‍රාවක අපගෙන් ඉල්ලා සිටින්නේ ඔවුන් වහන්සේගේ ප්‍රේමය කරණකොට ගෙන සධාරණ ලෙස කටයුතු කරන ලෙසයි.
* **නුඹලා අවංකව කථා කරන්නහු නම්, හරි දේ කරන්නහු නම් දුප්පතුන් රවටන්නට නුඹලාගේ බලය පාවිච්චි නොකරන්නාහු නම්.... නුඹලාට ජය අත්වේ.** (යෙසායා 33/15)

05. අප දෙස

* යුක්තිය ඉටුකරන්නට යැමේදී, අපට අනේකර දුක් පීඩා විඳිමට සිදුවනු ඇත. එහෙත් සැබැවින්ම එය දේව ආශිර්වාදයක් බව පුරාණ ගිවිසුමේ පවා, දෙවි සමිඳාණන් වහන්සේ දිවැසිවරුන් මඟින් සනාථ කල සේක.
* යහපත කරන්න ඉගෙන ගන්න. පීඩා විඳින්නන්ට පිහිට වන්න, අනාථයන්ගේ හිමිකම් රැක දෙන්න. වැන්දඹුවන් උදෙසා ඉදිරිපත් වෙන්න. මෙසේ යුක්තිය ඉටු කරන්න.

06. අවසාන යැදුම:

* අපි මොහොතක් නිශ්චලව සමිඳාණන් වහන්සේ අභියස පෙනී සිටිමු. අපට අද දින අනාවරණය තුළ ශු. කැමැත්ත ඉටු කරන්නට බාධා කරන මනුෂ්‍ය කැමැත්ත හඳුනා ගනිමු. අපගේ පාපිෂ්ඨ තත්ත්වයන් හඳුනා ගනිමු.
* සිටින තැන සිට සිටිය යුතු තැනට ගමන් කරන්නට, පසුතැවී සිත් හරවා ගනිමු.
* පුබුදු ගී 314 (නව මුද්‍රණය) 329 (පැරණි මුද්‍රණය)
  " ඔබගේ කැමැත්ත ඉටු කරන්නට මේ මොහොතේ......... "

******************